DOI: 10.31357/fhssmph.2011.00079

# විසිවන සියවසේ ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍යයේ ප්‍රවර්ධනය (1920-1999)

පූජ්‍ය. මීපිටියේ සීලරතන හිමි

01 NOV 2011

දර්ශනපති

2010

# විසිවන සියවසේ ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍යයේ ප්‍රවර්ධනය

# (1920-1999)

**පූජ්‍ය. මීපිටියේ සීලරතන හිමි**

ලි.ප. අංකය GS/HU/1531/2002

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති පරීක්ෂණය සඳහා සංස්කෘත විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.**

2010 දෙසැම්බර් 31

# අපේක්ෂකයාගේ ප්‍රකාශය

මේ නිබන්ධයේ අන්තර්ගතය මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමියන්ගේ සහ ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණ වාර්තාව කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ අනික් ආයතනයකට හෝ වෙනත් උපාධියක් / ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

| | |
|---|---|
| ........................................ | 2011/10/27 |
| අත්සන | දිනය |


මීපිටියේ සීලරතන හිමි

භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ගංගොඩවිල

නුගේගොඩ.

# උපදේශකවරුන්ගේ සහතිකය

2011. 09. 15 දින පැවති වාචික පරීක්ෂණයේ දී පරීක්ෂකවරුන් විසින් පෙන්වා දෙන ලද සංශෝධනයන් නිවැරදි කොට සකස් කරන ලද මෙම උපාධි නිබන්ධය විශ්වවිද්‍යාලයීය පශ්චාද් උපාධි පීඨයට භාර දීමට සුදුසු බව මෙයින් නිර්දේශ කරමු.

අත්සන ..............................

දිනය 2011/10/27

පූජ්‍ය මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි

සංස්කෘත අධ්‍යයනාංශය

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

අත්සන ..............................

දිනය 2011/10/27

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ

භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ගංගොඩවිල

නුගේගොඩ

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ
භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය.
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
ගංගොඩවිල, නුගේගොඩ.

| පටුන | පිටුව |
|---|---|


| | |
|---|---|
| **ස්තුතිය** | IV – V |
| **ප්‍රවේශය** | VI – VII |
| **සංක්ෂේපණ විධි** | VIII – IX |
| **සාරාංශය** | X – XI |
| **ප්‍රථම පරිච්ඡේදය** | |
| **හැඳින්වීම** | **1-32** |
| 1.1 පර්යේෂණ විෂය ක්ෂේත්‍රය | |
| 1.2 පර්යේෂණ ගැටළුව | |
| 1.3 ගැටළුව හැඳින්වීම | |
| 1.4 පර්යේෂණයේ අරමුණු | |
| 1.5 පර්යේෂණයේ ක්‍රමවේදය | |
| 1.6 පර්යේෂණයේ විෂය සීමාව | |
| 1.7 පර්යේෂණයේ පසුබිම | |
| **ද්විතීය පරිච්ඡේදය** | |
| **විසිවන සියවසේ ශ්‍රී ලංකාවේ සංස්කෘත භාෂා ශාස්ත්‍රයේ පිබිදීම** | **33 - 201** |
| 2.1 විසිවන සියවසේ ප්‍රාචීන අධ්‍යයනයේ පදනම | 33 - 39 |
| 2.2 විසිවන සියවසේ සංස්කෘත භාෂා අධ්‍යයනයේ පසුබිම | 40 - 42 |
| 2.3 විසිවන සියවසේ සංස්කෘත භාෂා ප්‍රවර්ධනයට බලපෑ හේතු | 43 - 134 |
| 2. 3. 1 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආරම්භ කිරීම | 43 - 50 |
| 2. 3. 2 විද්‍යෝදය පිරිවෙණේ ආරම්භය | 50 - 68 |
| 2. 3. 3 පැලියගොඩ විද්‍යාලඞ්කාර පිරිවෙණ ආරම්භ කිරීම | 68 - 75 |
| 2 3. 4 විදූදය විදූලකර ශාඛා පිරිවෙන් බිහිවීම | 75 - 77 |
| 2. 3. 5 පොදු අධ්‍යාපන දෙපාර්තමේන්තුව ආරම්භ කිරීම | 77 - 78 |
| 2. 3. 6 ප්‍රාචීන භාෂෝපකාර සමාගම ආරම්භ කිරීම හා එහි කාර්යභාරය | 78 - 84 |
| 2. 3. 7 පිරිවෙන් අධ්‍යාපනය ක්‍රමවත්වීම | 84 - 88 |
| 2. 3. 8 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ කිරීම | 88 - 100 |
| 2. 3. 9 විද්‍යෝදය විශ්වවිද්‍යාලය පිහිටුවීම | 100 - 117 |
| 2. 3. 10 විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය පිහිටුවීම | 118 - 122 |
| 2. 3. 11. දමිළ උගතුන්ගේ දායකත්වය | 122 - 134 |

2. 4 විසිවන සියවසේ බිහි වූ සංස්කෘත උගත්හු 134 - 189

2. 4. 1 දොඩංගොඩ සීලක්ඛන්ධ හිමි 135 - 137

2. 4. 2 විදුරුපොළ පියතිස්ස හිමි 137 - 139

2. 4. 3 මොරටුවේ සාසනරතන හිමි 139 - 140

2. 4. 4 බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය හිමි 140 - 144

2. 4. 5 ඕ. එච්. ද ඒ. විජේසේකර 144 - 147

2. 4. 6 ආනන්ද ඩබ්.පී. ගුරුගේ - ආනන්ද වැයිහේන පල්ලියගුරුගේ 147 - 150

2. 4. 7 ජයදේව තිලකසිරි 150 - 153

2. 4. 8 මහින්ද පලිහවඩන 153 - 158

2. 4. 9 හේන්පිටගෙදර ඥානසීහ හිමි 158 - 159

2. 4. 10 මාරඹ රතනසාර හිමි 159 - 162

2. 4. 11 එම්. එච්. එෆ්. ජයසූරිය - මහබදුගේ හිරණ්‍යා ප්‍රනාන්දු ජයසූරිය 162 - 167

2. 4. 12 සිරි ගුණසිංහ 167 - 169

2. 4. 13 කෛලාශනාථ කුරුක්කල් 169 - 172

2. 4. 14 සැම්සන් වීරතුංග 172 - 174

2. 4. 15 රත්නා හන්දුරුකන්ද 174 - 176

2. 4. 16 එස්. එල්. කැකුළාවල 176 - 178

2. 4. 17 විනයාගමූර්ති සිවසාමි 178 - 180

2. 4. 18 වෝල්ටර් මාරසිංහ 180 - 184

2. 4. 19 නවගමුවේ රේවත හිමි 184 - 186

2. 4. 20 එස්. ඒ. ජී. විජේසිංහ 186 - 189

2. 5 සංස්කෘත පරිවර්තකයෝ 190 - 199

2. 6 සංස්කෘත නිර්මාණකරුවෝ 199 - 201

**තෘතීය පරිච්ඡේදය**

**විසිවන සියවසේ රචිත සංස්කෘත මහාකාව්‍ය 202 -343**

3. 1. මහාකාව්‍ය ලක්ෂණ 202 - 205

3.2 පද්‍යචින්තාමණි මහාකාව්‍යය 205 - 311

3.2.1. කතුවරයා 205 - 209

3.2.2. අන්තර්ගතය 209 - 214

3.2.3. මූලාශ්‍රයෙහි හා මහාකාව්‍යයෙහි කථාවස්තුවෙහි සමවිෂමතා 214 - 219

3.2.4. චරිත නිරූපණය 219 - 261

3.2.5. රස නිෂ්පත්තිය 261 - 265

3.2.6. වර්ණනා 265 - 283
3.2.7 පද්‍යචින්තාමණි මහාකාව්‍යයෙහි ශෛලිය 284 - 309
3.2.8. වෘත්ත භාවිතය 309 - 311

3.3. මහාධර්මපාල කාව්‍යම් 311 - 343
3.3.1. කර්තෘ 311 - 314
3.3.2. මූලාශ්‍රය හා අන්තර්ගතය 314 - 319
3.3.3. මහාකාව්‍ය ලක්ෂණ 319 - 320
3.3.4. චරිත නිරූපණය 320 - 330
3.3.5. වර්ණනා 330 - 333
3.3.6. ශෛලිය 333 - 342
3.3.7. වෘත්ත භාවිතය 342 - 343

**චතුර්ථ පරිච්ඡේදය**

**මහාකාව්‍යවලින් හෙළිවන ආගමික, දේශපාලනික හා සමාජයීය තොරතුර 344 - 393**

4.1. ආගමික තොරතුරු 344 - 371
4.1.1. බුදුවරු 344 - 345
4.1.2. සිද්ධාර්ථ බෝධිසත්ත්ව 345 - 349
4.1.3. ගෞතම බුදු රජාණන් වහන්සේ 349 - 352
4.1.4. භික්ෂූන් වහන්සේ 352 - 358
4.1.5. බෞද්ධ දාර්ශනික සංකල්ප 359 - 362
4.1.6. වෛදික ආගම / හින්දු ආගම 363 - 370
4.1.7 වෙනත් ආගම් හා දර්ශන 371 - 371
4.2 දේශපාලනික තොරතුරු 372 - 380
4.3 සමාජයීය තොරතුරු 380 - 385
4.4 භූගෝලීය තොරතුරු 386 - 389
4.5 ජෛවීය තොරතුරු 390 - 393

**පඤ්චම පරිච්ඡේදය**

**සමාලෝචනය 394 - 405**

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 406 - 417**

**උපග්‍රන්ථය 01**

**උපග්‍රන්ථය 02**

# ස්තුති පූජා

සුහ මොහොතින් සකස්කඩ කියවා සංස්කෘත භාෂාවේ අත්පොත් තබා මා උගතකු කිරීමට අපමණ වෙහෙසක් දරූ අපවත් වී වදාළ මාගේ ආචාර්යෝත්තම පින්නවල ශ්‍රී පියරතන මාහිමියන් වහන්සේ, පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා අධ්‍යාපන ජීවිතයේ හමු වූ ජීවිතයෙන් ඉවත් ව ගිය ගිහි-පැවිදි ආචාර්ය භවතුන් පුණ්‍යානුමෝදනා පූර්වක ව අනුස්මරණය කරමි.

විශ්වවිද්‍යාල ජීවිතයේ දී හමු වූ උපනිෂද් ආචාර්යවරුන් වූ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම්මානිත මහාචාර්ය මහින්ද පලිහවඩන ඇදුරුතුමන්, නොකල්හි අහිමි ව ගිය මහාචාර්ය සැම්සන් වීරතුංග ඇදුරුතුමන් හා විශ්‍රාමික මහාචාර්ය වෝල්ටර් මාරසිංහ ඇදුරුතුමන් ගෞරවයෙන් සිහිපත් කරමි.

සංස්කෘත විෂය මෙන් ම ජීවිතය කියා දෙමින් දුබල වූ මගේ සිත ප්‍රබල කරමින් මෙම පර්යේෂණ කාර්යයේ දී මට ශක්තිය දුන් මෙහි උපදේශකවරයකු ද වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ ඇදුරුතුමන්, අධ්‍යයනාංශයේ සේවය කරන සන්මිත්‍ර ප්‍රියන්ත තිලකසිරි ප්‍රමුඛ සියලු ආචාර්ය භවතුන් සෙනෙහේ සිතින් සිහිපත් කරමි.

මෙහි උපදේශකයකු වන කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘත අධ්‍යයනය පිළිබඳ මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමියන්, වසර හතළිහක් වූ මගේ දිවිමගේ මා දුටු සොඳුරුතම කල්‍යාණ මිත්‍රයා වූ සැමදා ජීවිතයට ශක්තියක් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භූගෝලය අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පූජ්‍ය පින්නවල සංඝසුමන හිමි, කැලණිය විශ්වවිද්‍යාලයීය ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූලධර්ම අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, ළඟ හිඳිමින් සැමදා මට ශක්තියක් වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ තාවකාලික නිබන්ධක පූජ්‍ය කුඩාකත්නෝරුවේ විනීත හිමි හා භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ සංස්කෘත විෂය පිළිබඳ තාවකාලික නිබන්ධකවරුන් වශයෙන් සේවය කළ පූජ්‍ය තිකවැව නාගිත, පූජ්‍ය ශ්‍රාවස්තිපුර ශාන්තසිරි, පූජ්‍ය ගංගොඩවිල චන්දිම, පූජ්‍ය මීගොඩ සුමනරතන යන හිමිවරුන් හදබැති සිතින් සිහිපත් කරමි.

මෙම පර්යේෂණ කාර්යයේ දී තොරතුරු ලබා ගැනීමේ දී සහාය පළ කළ කටුපොතුවිල පන්ථාරාම විහාරාධිපති අතිගරු කැකුණවෙල පියරතන අනුනාහිමියන්, අතිගරු දවුල්දෙණ ඤාණිස්සර මහනාහිමි, මහාචාර්ය රත්නා හන්දුරුකන්ද මැතිණිය, නොකල්හි අපෙන් සමුගත් කැලණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එස්.ජී.ජී. විජේසිංහ ඇදුරුතුමන්, මහාචාර්ය පූජ්‍ය නවගමුවේ රේවත හිමි, මහාචාර්ය පූජ්‍ය කහපොල සුගතරතන හිමි ගෞරව පූර්වක බැති සිතින් සිහි කරමි.

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම්භාව්‍ය භාෂා අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය සනත් විජේසුන්දර ඇදුරුතුමන් හා විශ්වවිද්‍යාලයීය පුස්තකාලයාධිපතිතුමා හා ඔහුගේ කාර්ය මණ්ඩලය, කැලණිය විශ්වවිද්‍යාලයේ සංස්කෘත අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ඇඹෝගම විමලඤාණ හිමියන් ඇතුළු ඇදුරු මඬුල්ල, පුස්තකාලයාධිපතිතුමා හා කාර්ය මණ්ඩලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය මෙම පර්යේෂණ කාර්යයේ දී මට ලබා දුන් සහාය අගය කොට සලකමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී කුසුමලතා ලංකාමුල්ල මැතිණිය, සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර ඇදුරුතුමන් ලබැදි සිතින් සිහිපත් කරමි.

පොත්පත් සොයා දෙමින් පර්යේෂණ කාර්යයට අවකාශය සලසා දෙමින් සහාය පළ කළ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ දයාබර ශිෂ්‍ය පහලඹබඩගම ඤාණානන්ද, පනාමුරේ සුගතසිරි, ඕකන්දයායේ චන්ද්‍රාලෝක, ඉලුක්පිටියේ චන්ද්‍රානන්ද, හසලක සෝමරතන යන හිමිවරුන් හා සුනිල් ශාන්ත ඉතා ආදරයෙන් සිහිපත් කරමි.

හඳුනා ගත් දවසේ පටන් නිබඳ ව සෙනෙහස පළ කරන ප්‍රියන්ත - අනෝම යුවල හා දයාබර මෑණියන් කෘතවේදී ව සිහිපත් කරමි.

මෙම පර්යේෂණ කාර්ය ආරම්භයේ පටන් නිමවන තෙක් මට සහාය පළ කළ සියලු සහෘද පිරිසට කල්‍යාණ මිත්‍රත්වයේ කුසුම් පූජා කරමි.

# ප්‍රවේශය

භාරතයේ පහළ වූ සංස්කෘත භාෂා සාහිත්‍යය පෝෂණය කිරීමෙහි ලා ශ්‍රී ලාංකික දායකත්වය ප්‍රශංසනීය ය. එදා මෙදා තුර ලංකා ඉතිහාසයේ විවිධ වකවානුවල සංස්කෘත භාෂාවෙන් රචනා වූ නිර්මාණ මෙන් ම සම්භාව්‍ය සංස්කෘත සාහිත්‍යයේ විවිධ ග්‍රන්ථවලට කළ සන්‍ය, ව්‍යාඛ්‍යා, භාෂ්‍ය, ටීකා, සංස්කරණ ආදිය සිය ගණනකි. ජානකීහරණය වැනි උසස් මහාකාව්‍ය මෙන් ම සද්ධර්මමකරන්ද වැනි ගද්‍ය කාව්‍යයන් ද ලාංකික සංස්කෘත සාහිත්‍යය පෝෂණය කළේ ය.

විසිවන සියවස ලංකා සංස්කෘත සාහිත්‍යයේ මං සලකුණු තැබූ ශත වර්ෂයකි. විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන් හා තදනුබද්ධ ශාඛා පිරිවෙන් ආරම්භ කිරීම, ප්‍රාචීන භාෂෝපකාර සමාගම පිහිටුවීම, පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ හා මහාබෝධි සමාගමේ අනුග්‍රහයෙන් බෞද්ධ පාසල් ආරම්භ කිරීම ආදි සාධක නිසා ඇති වූ අධ්‍යාපන පුනරුදයේ ප්‍රතිඵල වශයෙන් විවිධ ක්ෂේත්‍රයන්හි පුළුල් අවබෝධයක් ඇති ගිහි පැවිදි උගතුන් විශාල පිරිසක් බිහිවිය.

විසි වන සියවසේ මුල් භාගයේ දොඩම්ගොඩ සීලක්ඛන්ධ, හික්කඩුවේ සුමංගල, බද්දේගම පියරතන, රත්මලානේ ධර්මාරාම, කහවේ රතනසාර වැනි පඬිවරුන්ගෙන් පසුව විසිවන සියවස මැද භාගයේ විදුරුපොල පියතිස්ස, බලංගොඩ ආනන්දමෛත්‍රෙය, යක්කල වික්‍රමාරච්චි, ජයසුන්දර ආරච්චි, සමරසිංහ, බුද්ධදාස, ආර්යදාස කුමාරසිංහ ආදි ගිහි පැවිදි උගත්තු බිහිවූහ. විසිවන සියවසේ අගභාගයේ සංස්කෘත නිර්මාණකරණයට එක්වූවන් අතර දවුල්දෙන ඤාණිස්සර, හේන්පිටගෙදර ඤාණසීහ, කැකුණවෙල පියරතන වැනි යතිවරු ප්‍රමුඛ වෙති.

1921 ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ කිරීම, 1959 විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පිහිටුවීම නිසා සංස්කෘත භාෂා ශාස්ත්‍රය සම්බන්ධ දෙස් විදෙස්හි ප්‍රගුණ කළ විශේෂඥ දැනුම සහිත උගතුන් පිරිසක් බිහි වූහ. ඔවුහු සංස්කෘත භාෂා සාහිත්‍යයේ විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කොට ශාස්ත්‍රීය ග්‍රන්ථ රචනා කළහ. සංස්කෘත භාෂා අධ්‍යයනය ව්‍යාප්ත කිරීම උදෙසා විසිවන සියවසේ පාඨ්‍ය ග්‍රන්ථ, ව්‍යාකරණ ග්‍රන්ථ හා ශබ්දකෝශාදිය රචනා විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම් වස් ඉදිරිපත් කරනු ලබන මෙම ශාස්ත්‍රීය පර්යේෂණයේ දී විසිවන සියවසේ ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍යයේ

ඇති වූ ප්‍රබෝධය, එහිලා බලපෑ සාධක හා එකී සංස්කෘත ප්‍රබෝධය තහවුරු කිරීම සඳහා මෙම යුගයේ රචනා වූ මහාකාව්‍ය පිළිබඳ අධ්‍යයනය කැරේ.

ප්‍රථම පරිච්ඡේදයෙහි මෙම අධ්‍යයනයේ පසුබිම සාකච්ඡා කෙරේ. ද්විතීය පරිච්ඡේදය වෙන් ව ඇත්තේ විසිවන සියවසේ සංස්කෘත භාෂා සාහිත්‍යයේ ප්‍රවර්ධනය සඳහා බලපෑ කරුණු සාකච්ඡා කිරීමට ය. තෘතීය පරිච්ඡේදයේ දී විසිවන සියවසේ රචනා කරන ලද ආර්යදාස කුමාරසිංහගේ රවීන්ද්‍රචරිතම්, කැකුණවෙල පියරතන හිමිගේ පද්‍යචින්තාමණි මහාකාව්‍යම් හා අහුංගල්ලේ විමලකීර්තිතිෂ්‍ය හිමිගේ මහා ධර්මපාල කාව්‍යම් යන සංස්කෘත මහාකාව්‍යත්‍රය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය. චතුර්ථ පරිච්ඡේදය මගින් සමකාලීන සමාජාර්ථික, දේශපාලනික හා ආගමික පසුබිම විවරණය කෙරේ.

**මෙම අධ්‍යයනය කිරීමේ දී පර්යේෂකයා මුහුණ දුන් ප්‍රධාන ම ගැටලුව වූයේ විසිවන සියවසට අයත් ආර්යදාස කුමාරසිංහගේ රවීන්ද්‍රචරිතම් අමුද්‍රිත පිටපත සොයා ගැනීම යි. එතුමාගේ අභාවයෙන් පසු ඔහු විසින් රචනා කරන ලද සියලු ම ග්‍රන්ථයන් හා අමුද්‍රිත පිටපත් සියල්ලේ අයිතිය ඔහුගේ බාල පුත්‍රයාට හිමි ව ඇත. වසර කිහිපයක් තිස්සේ ඔහු විදේශගත ව සිටින බැවින් එකී පිටපත ලබා ගැනීමට දරන ලද උත්සාහයන් සියල්ල ව්‍යර්ථ විය. එබැවින් මෙහි තෘතීය හා චතුර්ථ පරිච්ඡේදයන් හි අධ්‍යයනයට ලක් වන්නේ සෙසු මහාකාව්‍යද්වය පමණි.**

## සංක්ෂේපණ විධි

| | | |
|---|---|---|
| කා.ද. | = | කාව්‍යාදර්ශය |
| කා.ප්‍ර. | = | කාව්‍යප්‍රකාශ |
| කා.ල. | = | කාව්‍යාලංකාර |
| කා.සු | = | කාව්‍යාලංකාර සූත්‍රවෘත්ති |
| නා.ශා. | = | නාට්‍යශාස්ත්‍ර |
| ද.රූ. | = | දශරූපය |
| ධ.පා. | = | මහා ධර්මපාල කාව්‍ය |
| ප.චි. | = | පද්‍යචින්තාමණි |
| පා.ගී. | = | පාලි ගීතාඤ්ජලී |
| ප්‍රා.භා.ස.ශා.ස. | = | ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ශාස්ත්‍රීය සංග්‍රහය |
| පු.වි.දෙ.ඉ. | = | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය |
| පූ.ජී. | = | පූජිත ජීවිත |
| බ්‍රි.ප්‍ර.බු.පි.අ. | = | බ්‍රිතාන්‍ය ප්‍රතිපත්ති බුදුසමය හා පිරිවෙන් අධ්‍යාපනය |
| ම.නු.පු. | = | මන්දාරම් නුවර පුවත |
| මෑ.ශ්‍රී.ල.සං.උ. | = | මෑත කාලයේ ශ්‍රී ලංකාවේ සංස්කෘත උගත්තු |
| මි.ප. | = | මිළින්දපඤ්හ |
| ර.පා.වා. | = | රජයේ පාලන වාර්තා |
| ල.අ.සි.ප්‍ර. | = | ලංකාවේ අධ්‍යාපන සියවස ප්‍රකාශනය |
| ල.ආ.ගැ.නි. | = | ලංකා ආණ්ඩුවේ ගැසට් නිවේදන |
| ල.ආ.ප.වා. | = | ලංකා ආණ්ඩුවේ පරිපාලන වාර්තා |
| වැ.ස.ස.ප්‍ර. | = | වැලිවිට සරණඞ්කර සංඝරාජ ප්‍රණාමය |
| වි.දා.ස.වා. | = | විද්‍යාලංකාර දායක සභා වාර්තා |
| වි.පි.ශ.ස. | = | විද්‍යාලංකාර පිරිවෙන් ශත සංවත්සරය |
| වි.වි.මූ.වා. | = | විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ මූලික වාර්තාව |

| | | |
|---|---|---|
| වි.ව.ක. | = | විද්‍යාලංකාර වජ්‍රජයන්ති කලාපය |
| වි.ල.බෞ.ස. | = | විද්‍යාලංකාර බෞද්ධ සංගමය |
| ශ්‍රීවි.වි.නි.නි.ප. | = | ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ නියෝග හා නිර්දේශ පත්‍ර |
| වි.ව.පූ.වා. | = | විද්‍යෝදයාශීති වර්ෂ පූර්ති වාර්තාව |
| වි.බෞ.ස. | = | විද්‍යෝදය බෞද්ධ සංගමය |
| වි.ම.වා.පා.වා. | = | විද්‍යෝදය මණ්ඩප වාර්ෂික පාලන වාර්තාව |
| ල.අ.සි.ප්‍ර. | = | ලංකාවේ අධ්‍යාපන සියවස ප්‍රකාශනය |
| ශ්‍රීල.බෞ.අ.ස. | = | ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය |
| ශ්‍රීවි.වි.කො.ස.වා. | = | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කොමිසම් සභා වාර්තාව |
| ශ්‍රීල.වි.වි.වි.වා.වා. | = | ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා |
| ශ්‍රීල.වි.වි.වි.ම.පා.වා. | = | ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ මණ්ඩප පාලන වාර්තාව |
| ල.වි.ල.ඉ. | = | ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය |
| ශ්‍රීජ.වි.වි.වා.වා. | = | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා |
| ශ්‍රී.ස.අ.ම.ස. | = | ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන |
| ශ්‍රී.සු. | = | ශ්‍රී සුමංගල |
| ශ්‍රී.ප්‍රි.ච. | = | ශ්‍රී ප්‍රියරත්න චරිතය |
| ශ්‍රී.සෝ.සා. | = | ශ්‍රී සෝරත සාහිත්‍යය |
| ශ්‍රී.සු.ච. | = | ශ්‍රී සුමංගල චරිතය |
| ස.බෞ.ආ. | = | සමීපාතීතයේ බෞද්ධ ආචාර්යයෝ |
| ස.ර. | = | සද්ධර්මරත්නාවලිය |
| ස.ශ. | = | සංස්කෘත ශබ්දාර්ණවය |
| ස.සා.ච. | = | සංඝරාජ සාධු චරියාව |
| සි. සා. ව. | = | සිංහල සාහිත්‍ය වංශය |
| හ.ච. | = | හර්ෂචරිතය |
| හ.ස. | = | හංසසංදේශය |
| T.S.T.S.L.T. | = | The Sanskrit Tradition of the Sri Lankan Tamils |

# විසිවන සියවසේ ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍යයේ ප්‍රවර්ධනය ( 1920-1999)

මීපිටියේ සීලරතන හිමි

## නිබන්ධ සාරාංශය

සංස්කෘතය වූ කලී ග්‍රීක භාෂාවට වඩා පරිපූර්ණ වූත් ලතින් භාෂාවට වඩා විස්තෘත වූත් විද්‍යාත්මක ව්‍යාකරණයකින් හෙබි සර්වකාලීන විශ්ව භාෂාවකි. ඉන්දියානුවන්ගේ බුද්ධිමය භාෂාව ලෙස සම්භාවිත එය පූජනීයත්වයට හා ගෞරවයට ලක් වූ සජීවී භාෂාවකි. අනාදිමත් කාලයක සිට භූගෝලීය, සමාජාර්ථික, දේශපාලනික, සංස්කෘතික හා ආගමික වශයෙන් ඉන්දියාව සමග ඉතා සමීප සම්බන්ධතාවක් පවතින ශ්‍රී ලංකාවට සංස්කෘත භාෂාවේ නොමඳ ආභාසයක් ලැබී ඇත. එබැවින් අනුරපුර යුගයේ පටන් අද දක්වා ශ්‍රී ලාංකික සංස්කෘතයේ භාවිතය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ප්‍රවර්ධනය වී තිබේ. එබැවින් ශ්‍රී ලාංකික ආගමික හා ආධ්‍යාපනික පුනරුදයේ කැපී පෙනෙන යුගයක් නියෝජනය කරන විසිවන සියවසෙහි සංස්කෘත භාෂා සාහිත්‍යය විෂයයෙහි ඇති වූ ප්‍රබෝධය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂයේ ප්‍රධාන අරමුණ වේ. එම ප්‍රබෝධය තුළින් ඉස්මතු වී පෙනෙන සංස්කෘත මහාකාව්‍ය සම්ප්‍රදායත් ඒවායින් හෙළිවන භාෂා ලක්ෂණ, අලංකාර භාවිතය, වර්ණනා චාතුර්යය හා තත්කාලීන ආගමික, දේශපාලනික, සමාජයීය, භූගෝලීය හා ජෛවීය තොරතුරු විග්‍රහ කිරීමත් මෙම අධ්‍යයනය මගින් අපේක්ෂා කෙරේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා මූලාශ්‍රය පරිශීලනය, සම්මුඛ සාකච්ඡා, දත්ත හා තොරතුරු විශ්ලේෂණය යන ප්‍රධාන අංශයන් ඔස්සේ පර්යේෂණ ක්‍රමවේදය ගොඩ නගා ඇත.

මෙම පර්යේෂණයේ ප්‍රතිඵල අතර විසිවන සියවසේ ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍යයේ ප්‍රබෝධය කෙරෙහි එකල ඇති වූ ආධ්‍යාපනික ප්‍රබෝධය බෙහෙවින් ඉවහල් වී ඇති ආකාරය හඳුනා ගත හැකි ය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යෝදය - විද්‍යාලංකාර පිරිවෙන්, තදනුබද්ධ පිරිවෙන්, ප්‍රාචීන භාෂෝපකාර සමාගම, පරමවිඥානාර්ථ සමාගම මගින් ආරබ්ධ බෞද්ධ පාසල්, ලංකා විශ්වවිද්‍යාලය, විද්‍යෝදය - විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ආදි ආයතන මෙම ප්‍රබෝධයේ දී සක්‍රිය දායකත්වයක් සපයා ඇත.

දේශීය හා විදේශීය වශයෙන් සංස්කෘත භාෂා ප්‍රවීණත්වය ලැබූ විවිධ විෂයක්ෂේත්‍රයන් හි පර්යේෂණ කාර්යයන්හි නියුතු වූ ප්‍රමාණික උගතුන් රැසක් බිහිවීම ශ්‍රී ලාංකික සංස්කෘත ප්‍රබෝධය කෙරෙහි හේතු වූ සුවිශේෂී සාධකයකි. සංස්කෘත භාෂා ප්‍රවීණත්වය ඔස්සේ සිය නිර්මාණ කෞශල්‍යය ප්‍රකට කළ සංස්කෘත නිර්මාණකරුවන්ගෙන්, සංස්කෘත භාෂාවේ ප්‍රවර්ධනය අරඹයා ක්‍රියා කළ පාඨ ග්‍රන්ථ රචකයන්ගෙන්, ව්‍යාකරණකරුවන් හා ශබ්දකෝශකරුවන්ගෙන් සිදු වූ මෙහෙය ප්‍රශංසනීය වේ. මෙම සාහිත්‍ය ප්‍රබෝධයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ සංස්කෘත සාහිත්‍යයට අනන්‍ය වූ මහාකාව්‍යය සම්ප්‍රදාය වඩාත් පෝෂණය වීම යි. මෙම වකවානුව තුළ ලියවුණු රවීන්ද්‍රචරිතය, පද්‍යචින්තාමණි හා මහා ධර්මපාල කාව්‍යය මෙයට සාක්ෂි සපයයි. කථාවස්තුවේ විකාශනය, චරිත නිරූපණය, වර්ණනා, රස නිෂ්පත්තිය, අලංකාර ප්‍රයෝග හා ශෛලිය යන අංගයන්ගෙන් පරිපූර්ණත්වයට පත් වූ මහාකාව්‍ය මෙම සියවසේ සංස්කෘත සාහිත්‍යයේ ප්‍රවර්ධනය තහවුරු කරන ප්‍රශස්ත අංගයක් වශයෙන් හැඳින්විය හැක. මෙම සුවිශේෂ මහා කාව්‍ය සම්ප්‍රදාය තුළ විසිවන සියවසේ ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍යයේ පහළ වූ අග්‍රඵලය ලෙස පද්‍යචින්තාමණි මහාකාව්‍ය සැලකිය හැකිය.